සැ. යු.- 2010.09.24 දින පළවූ අංක 1,673 දරන ගැසට් පත්‍රයේ I-II (අ) සහ IV (අ) කොටස් පළ නොවීය.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,674 - 2010 ඔක්තෝබර් මස 01 වැනි සිකුරාදා - 2010.10.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | 1588 |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1589 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ඔක්තෝබර් මස 08 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 සැප්තැම්බර් මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1587- B 080158— 7,100 (2010/10)
F1-(S)

# ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය

**1987 අංක 42 දරන පළාත් සභා පනතේ IV වන කොටසේ 32 (1) වගන්තිය යටතේ වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරන ලද පත්වීම්**

| *අනු. අංකය* | *නම/සේවය/පන්තිය/ශ්‍රේණිය* | *පත්කරන ලද තනතුර/කාර්යාලය/ ක්‍රියාත්මක වන දිනය* |
|---|---|---|
| 01 | ඩී. එම්. බී. දිසානායක මහතා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.07.01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ඉංජිනේරු තනතුර සඳහා |
| 02 | එම්. කේ. ඩී. ආර්. ටී. මල්ලවආරච්චි මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.07.01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ඉංජිනේරු තනතුර සඳහා |
| 03 | ඩබ්ලිව්. ජේ. එල්. ඩී. අයි. වික්‍රමසිංහ මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.07.01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ විදුලි ඉංජිනේරු තනතුර සඳහා |
| 04 | ජී. ඒ. කේ. එම්. බණ්ඩාර මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.07.01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි වයඹ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ඉංජිනේරු තනතුර සඳහා |
| 05 | ඩී. එම්. ඩී. එස්. දිසානායක මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.07.01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ඉංජිනේරු තනතුර සඳහා |
| 06 | එන්. පී. කුමාරසිංහ මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.05.03 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි කුරුණෑගල විධායක ඉංජිනේරු කාර්යාලයේ විධායක ඉංජිනේරු තනතුර සඳහා |
| 07 | ජේ. එම්. එස්. අයි. බණ්ඩාර මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.05.03 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි හලාවත විධායක ඉංජිනේරු කාර්යාලයේ විධායක ඉංජිනේරු තනතුර සඳහා |
| 08 | එස්. එන්. ජයසිංහ මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.05.03 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ආණමඩුව විධායක ඉංජිනේරු කාර්යාලයේ විධායක ඉංජිනේරු තනතුර සඳහා |
| 09 | පී. ඒ. ඒ. එන්. කුලරත්න මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ II පංතිය | 2010.07.15 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලස්ථාන ඉංජිනේරු තනතුර සඳහා |
| 10 | ජේ. එස්. ජයතිස්ස මයා<br>ශ්‍රී. ලං. ඉං. සේ. II/ I පංතිය | 2010.07.01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තනතුර සඳහා |
| 11 | කේ. පී. සී. ධර්මසිරි මයා<br>ශ්‍රී. ලං. ක්‍ර. සේ. II/ II පංතිය | 2010.08.03 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මකවන පරිදි පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක. වනිතා කටයුතු ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) තනතුර සඳහා |
| 12 | බී. විජේරත්න මයා<br>ශ්‍රී. ලං. කෘෂි. සේ. I පංතිය | 2010.07.02 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මකවන පරිදි වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුර සඳහා |
| 13 | එස්. එම්. ඩී. කේ. ජයසිංහ මිය<br>ශ්‍රී. ලං. ග. සේ. II/ II පංතිය | 2010.08.04 දිනැති ලිපියෙන් වහාම ක්‍රියාත්මකවන පරිදි කුලියාපිටිය කලාප අධ්‍යාපන කාර්යාලයේ ගණකාධිකාරි තනතුර සඳහා |

ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ආර්. ඒ. තිලකරත්න,
වයඹ ආණ්ඩුකාරවර ලේකම්.

2010 සැප්තැම්බර් මස 24 වැනි දින,
වයඹ ආණ්ඩුකාරවර කාර්යාලය.

10-20

# තනතුරු - ඇබෑර්තු

**වයඹ පළාතේ පළාත් සභාව**

සභා ලේකම් කාර්යාලය

වයඹ පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල සේවාව 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 17 වැනි වගන්තියට අනුව ස්ථාපනය කර ඇති, වයඹ පළාත් සභාවේ (සභා ලේකම් කාර්ය මණ්ඩල) සේවයේ මතු දැක්වෙන තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත මීට අමුණා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සකස් කොට ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2010.11.15 දින හෝ එදිනට පෙර, "කුරුණෑගල පළාත් සභා සංකීර්ණය, 4 වැනි මහල, සභා ලේකම්, කාර්යාලය, සභා ලේකම්" නමට ලියාපදිංචි තැපෑලෙන් එවීමට ක්‍රියාකළ යුතු වේ.

ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ විසින් ඉල්ලුම් කරන තනතුරු නාමය සඳහන් කළ යුතු වේ. මීට අදාළ ඉල්ලුම්පත්‍රය හෝ ලියවිලි කිසිවක් අතින් භාරගනු නොලැබේ. ඉල්ලුම් පත්‍රයට කිසිදු ලියවිල්ලක් අමුණා එවිය යුතු නොවේ.

1. **තනතුරු නාමය**
**සහකාර ලේකම් (තනතුරු 01යි)**

1.1 *වැටුප් පරිමාණය* : S.L. 1-2006 රු.22,935-10x645-8 x790-17 x 1,050 - රු. 53,555 (රා.පරි.ලේ.චක්‍රලේඛ 06/2006 ට අදාළ S.L.I. වැටුප් පරිමාණයේ II වැනි පංතියට අයත් කොටස පමණක් අදාළ වේ.)

1.2 **සුදුසුකම්** :

(i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරියෙකු වීම ; හෝ

(ii) රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක කළමනාකරණ සහකර සේවයේ අධි පංතියේ අවුරුදු 08කට වැඩි සේවයක් තිබීම ; හෝ

(iii) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) සේවයක සංස්කාරක II පන්තිය කළමනාකරණ සහකාර I පන්තිය, යන තනතුරු වල හෝ ඊට සමාන්තර තනතුරක අවුරුදු 10 කට වඩා වැඩි සේවයක් තිබීම ; හෝ

(iv) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) සේවයක කළමනාකරණ සහකාර සේවයේ අධි පන්තිය, සංස්කාරක I පන්තිය, යන තනතුරක හෝ ඊට සමාන්තර තනතුරක වසර 06 කට වඩා වැඩි සේවයක් තිබීම ; හෝ

(v) නීතිය පිළිබඳව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව උපාධිය ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක ද්විතීය ශ්‍රේණියක හෝ ඉහළ ශ්‍රේණියක අවු.10 ක අවම සේවයක් තිබීම ; හෝ

(vi) පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් සහිතව උපාධිය ලබා ගැනීමෙන් පසු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ හෝ පළාත් සභා ලේකම් කාර්යාලයක ද්විතීය ශ්‍රේණියක හෝ ඉහළ ශ්‍රේණියක අවු. 10 ක අවම සේවයක් තිබීම ;

(vii) ඉහත සුදුසුකම්වලට අමතරව පහත සඳහන් සුදුසුකම් අතිරේක සුදුසුකම් සේ සළකනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පළාත් සභාවට අදාළ පනත් හා වයඹ පළාත් සභාව විසින් පනවා ඇති ප්‍රඥප්ති හා රීති පිළිබඳ දැනුම

(ආ) සේවක මණ්ඩල කළමනාකරණ පිළිබඳ පළපුරුද්ද හා කුසලතාවය

(ඇ) ඉංග්‍රීසි හා දෙමළ භාෂා පිළිබඳ ප්‍රවීනතාවය

(ඈ) වයඹ පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු වීම

(viii) ඉහත 1.2 හි II III IV V VI යන අනුච්ඡේදවල සේවා කාලයන් 2010.10.01 වැනි දිනට අදාළ වේ.

1.3 **තෝරා ගැනීමේ පළිවෙළ** :
ඉල්ලා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙනි.

2. **අදාළවන පොදු කොන්දේසි**

2.1 මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් හිමිය.

2.2 ශ්‍රී ලංකාණ්ඩුවේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 10 වැනි සහ 12 වැනි වගන්තිවල සඳහන් සෙසු කොන්දේසි ද, 1990 අංක 9 දරන ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 6 දරන පළාත් සභාවේ පළාත් සභා (ලේකම් කාර්ය මණ්ඩල) ප්‍රඥප්තියේ විධි විධානයන් ද, පළාත් සභාව විසින් කලින් කලට පනවනු ලබන විධි විධානයන් ද, මෙම තනතුරු සඳහා බලපැවැත්වෙනු ඇත.

2.3 විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය.

2.4 සේවය ස්ථිර කර තිබීම :

2.4.1 පසුගිය අවුරුදු 05ක කාලය තුළ සියලුම වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතු ය.

2.5 දැනට වැඩ තහනමකට භාජනය වූ හෝ විනය ක්‍රියා මාර්ග ආරම්භ කර ඇති අයට මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ නොහැකිය.

3. *වෙනත් කරුණු* :

3.1 ඉල්ලුම් පත්‍රය මෙයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුව තමා විසින් පිළියෙළ කරගත යුතු ය.

3.2 ඉල්ලුම් පත්‍රය තමන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, තෝරාගනු ලැබුවහොත් වර්තමාන සේවා ප්‍රධානියා විසින් ආයතන සංග්‍රහයේ විධි විධාන අනුව මුදා හැරීමට එකඟත්වය පළ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

3.3 තනතුරට තෝරා ගැනීම හෝ මෙම නිවේදනයේ සඳහන් නොවූ කරුණු සම්බන්ධයෙන් අවසානාත්මක තීරණය ගැනීම පළාත් සභාවේ ලේකම්වරයා සතු වේ.

එස්. ආර්. ඒ. සමරකෝන්,
සභා ලේකම්,
වයඹ පළාතේ පළාත් සභාව.

2010 සැප්තැම්බර් මස 15 වැනි දින,
සභා මන්දිරය,
4 වන මහල,
පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

***වයඹ පළාතේ පළාත් සභා ලේකම් කාර්ය මණ්ඩල සේවයේ සහකාර ලේකම් තනතුර සඳහා ඉල්ලුම් පත්‍රය***

1. මුලකුරු සමඟ අගට යෙදෙන නම :——————.
2. සම්පූර්ණ නම :——————.
3. උපන් දිනය :——————.
4. ස්ත්‍රී / පුරුෂ භාවය :——————.
5. විවාහක / අවිවාහක බව :——————.
6. පෞද්ගලික ලිපිනය :——————.
7. දැනට දරන තනතුර / පන්තිය / ශ්‍රේණිය :——————.
8. දැනට සේවය කරන කාර්යාලය :——————.
9. රාජකාරි ලිපිනය :——————.
10. 10.1 දැනට දරන තනතුරට පත් වූ දිනය :——————.
    10.2 අදාළ තනතුර ස්ථිර කර තිබේද යන වග :——————.
11. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට මුළු සේවා කාලය ඃ
    අවු. :——————, මාස :——————. දින :——————.
    සේවා ස්ථාන :——————.

| සිට | දක්වා | දෙපාර්තමේන්තුව | සේවා ස්ථානය |
|---|---|---|---|
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |
| ............ | ............ | ............ | ............ |

12. අධ්‍යාපන සහ වෙනත් සුදුසුකම් :——————.
13. වැටුප් වර්ධක උපයාගෙන තිබීම :——————.
    13.1 පසුගිය අවුරුදු 5 තුළ සියලු වැටුප් වැඩිවීම උපයාගෙන තිබේ ද? : ——————.
14. දැනට රාජකාරි තහනමකට භාජනය වී හෝ විනය ක්‍රියාමාර්ග ආරම්භ කර හෝ තිබේ ද ? :——————.

ඉහත සඳහන් කර ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, සත්‍ය බවත්, ඒවායින් කිසිවක් සදොස් බව බඳවා ගැනීමට කළින් අනාවරණය වුවහොත් අපේක්ෂකත්වය අවලංගු වන බවත්, බඳවා ගැනීමට පසුව අනාවරණය වුවහොත් පත්වීම අවලංගු කිරීම හෝ අවසන් කිරීමට හෝ හේතුවන බවට, එකඟව පහත අත්සන් තබමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

........................... මහතා / මිය / මෙනවිය විසින් ඉහත සඳහන් කර ඇති සියලු තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව නිවැරදි බව ද, ඉහත තනතුරු සඳහා ඔහු / ඇය තෝරාගනු ලැබුවහොත් මුදා හැරීමට එකඟවන බව ද / නොවන බව ද සහතික කරමි. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. / නිර්දේශ නොකරමි.

——————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :——————.

10-208

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ *රු. ශ.* | තැපැල් ගාස්තුව *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## *උපලේඛනය*

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| ඔක්තෝබර් | 2010.10.01 | සිකුරාදා | 2010.09.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.08 | සිකුරාදා | 2010.09.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.15 | සිකුරාදා | 2010.10.01 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.21 | බ්‍රහස්පතින්දා | 2010.10.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.10.29 | සිකුරාදා | 2010.10.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| නොවැම්බර් | 2010.11.04 | බ්‍රහස්පතින්දා | 2010.10.21 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.11.12 | සිකුරාදා | 2010.10.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.11.19 | සිකුරාදා | 2010.11.04 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.11.26 | සිකුරාදා | 2010.11.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| දෙසැම්බර් | 2010.12.03 | සිකුරාදා | 2010.11.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.10 | සිකුරාදා | 2010.11.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.17 | සිකුරාදා | 2010.12.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.24 | සිකුරාදා | 2010.12.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.12.31 | සිකුරාදා | 2010.12.17 | සිකුරාදා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.